සභාපති
தலைவர்
Chairman
(+94) 011 2556840

ලේකම්
செயலாளர்
Secretary
(+94) 011 2556831

කාර්යාලය
காரியாலயம்
Office
(+94) 0112556834
0113071324

ෆැක්ස්
தொ.நகல,
Fax
(+94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்:
e-mail
fincom@sltnet.lk

මුදල් කොමිෂන් සභාව
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ඊ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

நிதி ஆணைக்குழு
(அரசியலமைப்பின் 154`ண ஆம் உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)

FINANCE COMMISSION
(Established under Article 154 R of the Constitution)

48, වජිර පාර,
කොළඹ 04. ශ්‍රී ලංකා

48, வஜிரா வீதி,
கொழும்பு-04, இலங்கை.

48, Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංකය
எனது இல
My No
FC/3/2/2018

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date
2017.11.24

ප්‍රධාන ලේකම්,

බස්නාහිර, මධ්‍යම, දකුණු, උතුරු, වයඹ, උතුරු මැද, ඌව, සබරගමුව සහ නැගෙනහිර පළාත.

හිතවත් ප්‍රධාන ලේකම්තුමනි,

**<u>පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම - 2018 පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ</u>**

## 1. හැඳින්වීම

පළාත තුළ වෙසෙන ජනතාවගේ සමාජ-ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමේදී පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම ඉතා වැදගත් ලේඛනයක් වේ. මෙම අරමුණ මත පදනම්ව අදාල මාර්ගෝපදේශ පිළියෙල කරනු ලබන අතර, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සහ උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ අරමුදල් වෙන් කිරීම හා ඒවා උපයෝජනය කිරීම සඳහා මෙය පදනම වනු ඇත. "2018 වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම" යන මැයෙන් FC/3/2/2018 හා FC/06/01/2018 යන අංක දරන 2017.11.10 දිනැති ලිපිය සමග පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන, සාමූහික ප්‍රදාන සහ විදේශීය ආධාර ව්‍යාපෘති යටතේ අරමුදල් වෙන් කිරීමට අදාල විස්තර ඔබ වෙත සපයා ඇත.

ඔබ පළාතට වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන සඵලදායී ලෙස උපයෝජනය කිරීම පහසුකරලීමේ අරමුණින් මෙම මාර්ගෝපදේශ නිකුත් කරන බව කාරුණිකව සැලකුව මැනවි. ඒ අනුව, ඔබ පළාතේ 2018 වාර්ෂික සංවර්ධන සැලැස්ම සැකසීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි නියමිත අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## 2. ජාතික ප්‍රතිපත්ති රාමුව

ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පළාත්වල විධායක බලය සහ සැලසුම්කරණය ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව, 2018 වර්ෂය සඳහා පළාත් සංවර්ධන ප්‍රමුඛතාවයන් තීරණය කිරීමේදී විශේෂිත ආංශික ජාතික ප්‍රතිපත්ති සහිත ජාතික ප්‍රතිපත්තිමය මගපෙන්වීම් අනුගමනය කිරීමට වගබලා ගත යුතු වේ. එබැවින්, අදාල ප්‍රතිපත්ති ප්‍රකාශනයන් මැනවින් අධ්‍යයනය කරන ලෙස පළාත් බලධාරීන්හට ඔබ විසින් උපදෙස්

සැපයීම සිදු කළ යුතු වේ. ඉතා වැදගත් ප්‍රතිපත්තිමය ලේඛනයන්ගෙන් උපුටාගත් ප්‍රධාන කරුණු සමහරක් පහත දැක්වේ.

### 2.1. 2025 දැක්ම :

"රජයේ ආර්ථික දැක්ම" වනුයේ, 2025 වනවිට ශ්‍රී ලංකාව පොහොසත් රටක් බවට පත්කරලීමයි. මෙහිදී, දැනුම පදනම් කරගත් ඉතා තරගකාරී සමාජ-වෙළඳපොළ ආර්ථිකයක් සමග ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කෙරෙනු ඇත. මෙම තත්ත්වය තුළ සියලු පුරවැසියනට ඉහළ ආදායමක් හා හොඳ ජීවන මට්ටමක් ළඟාකර ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ අපනයන මුල්කරගත් ආර්ථිකයක කේන්ද්‍රස්ථානය බවට පත්වනු ඇත.

"ආර්ථික වර්ධනයට නව ප්‍රවේශයක්" යන්න කේන්ද්‍ර කරගත් සංවර්ධන ප්‍රතිපත්ති ලේඛනය තුළ සංචාරක කර්මාන්තය, ශ්‍රම වෙළඳපොළ, භෞතික යටිතල පහසුකම්, සමාජ ආරක්ෂණ ජාලය, කෘෂිකර්මය හා තිරසාර සංවර්ධනය, ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය, පරිසරය හා ආපදා කළමනාකරණය, සහ යහපාලනය හා වගවීම වැනි අංශවලට වැඩි අවධානයක් යොමු කර ඇති අතර, පළාත්වලට ද මේ සම්බන්ධයෙන් බලපෑම් සිදු කළ හැකිය. මෙම තත්ත්වය තුළ 2025 දැක්ම යටතේ හඳුන්වාදී ඇති ප්‍රතිපත්තිවලට අනුව ජාතික සංවර්ධනයට දායකවීම පළාත්වලින් අපේක්ෂා කෙරේ.

### 2.2. තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව "තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය" සඳහා එකඟතාවය පළකර ඇත. මෙහි අභිමතාර්ථ 17 ක් සහ ඉලක්ක 169 ක් අන්තර්ගත වේ. මෙම න්‍යාය පත්‍රයට අනුගත වීම තුළ "කිසිවෙකු මගහැර නොයෑම" යන සමස්ත ප්‍රතිඥාව සමග විශ්වීය, පරිවර්තනීය, අදාල සියල්ල ඇතුළත් හා ඒකාබද්ධ වූ තිරසාර සංවර්ධන රාමුවකට ශ්‍රී ලංකාව බැඳී සිටී. මෙම රාමුව ඒකාබද්ධතාවයෙන් හා නොබෙදිය හැකි භාවයෙන් යුක්ත වන අතර, එමගින් ආර්ථික, සාමාජීය හා පාරිසරික යන මූලික තිරසාර සංවර්ධන මානයන් සමබරව පවත්වා ගනු ඇත. අප රටෙහි සංවර්ධන ප්‍රතිපත්ති රාමුව හා උපායමාර්ගික සංවර්ධන ප්‍රමුඛතා සැලකිල්ලට ගනිමින් මෙකී ගෝලීය න්‍යාය පත්‍රය ශ්‍රී ලාංකික සන්දර්භය තුළට ප්‍රාදේශීය ගත කරනු ඇත. ජාතික හා පළාත් මට්ටමෙන් සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලියට නායකත්වය සපයමින් තිරසාර සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ ප්‍රවේශයකට මෙම න්‍යාය පත්‍රය මගින් අතිප්‍රසාරී රාමුවක් ස්ථාපනය කරනු ඇත. තිරසාර සංවර්ධන අරමුණු පහත දැක්වෙන කරුණුවලින් යුක්ත වේ.

- පරිවර්තනීය හා වෙනස්කම්වලට ලක්වීමේ නැඹුරුව.
- අනාගතය මුල්කර ගැනීම.
- තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාකාරකම්වලට නැඹුරුවීමේ ක්‍රියාවලිය මැදිකාලීන කඩිනම්භාවය හරහා කෙටි කාලීනව ප්‍රධාන ධාරාවට පිවිසීමේ සිට දිගුකාලීනව ප්‍රතිපත්තිමය එකඟතාවය දක්වා ගමන් කරනු ඇත.
- දේශපාලනමය හැසිරවීමේ කාර්යභාරය.

### 2.3. රාජ්‍ය ආයෝජන වැඩසටහන

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද "රාජ්‍ය ආයෝජන වැඩසටහන" (2017 - 2020) තුළ ඇස්තමේන්තු කරන ලද ඉහළ වර්ධන වේගයක් හා සමාජ සාධාරණත්වය සමග අනුගත වෙමින් පහත දැක්වෙන මධ්‍යකාලීන අපේක්ෂාවන් හඳුනාගෙන ඇත.

- කර්මාන්තවල ඵලදායීතාවය හා තරගකාරීභාවය වැඩිදියුණු කිරීම තුළින් අපනයන, කාර්ය සාධනයෙහි දැනට දක්නට ලැබෙන පහත වැටීම වළක්වාලීම.
- රට තුළ ආයෝජන මිත්‍රශීලී පරිසරයක් ඇති කරලීම තුළින් විදේශ ආයෝජන ගලා ඒම ප්‍රවර්ධනය කරලීම.
- බදු පරිපාලනයට විශේෂ අවධානය යොමු කරමින් රාජ්‍ය ආදායම් ක්ෂේත්‍රය තුළ අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
- මානව සම්පත්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස රාජ්‍ය සම්පත්වලින් විශාල ප්‍රමාණයක් වෙන් කරලීම.
- ප්‍රාදේශීය හා පළාත් ආයතන ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සමාජයීය හා ආර්ථික ක්ෂේත්‍රයන් තුළ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරලීම.
- රාජ්‍ය සම්පත් වෙන් කිරීමේදී දරිද්‍රතාවය සහිත නිශ්චිත ප්‍රදේශවලට වැඩි අවධානය යොමු කරමින් දැනට පවත්නා ප්‍රාදේශීය විෂමතා අවම කරලීම.
- රට තුළ සිදුවන ස්වාභාවික විපත්වල අහිතකර ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් පරිසර ආරක්ෂණය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරලීම.

## 3. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන ජාතික වැඩසටහන්

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන ජාතික වැඩසටහන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඵලදායී අයුරින් ළඟා කරගැනීමට දායකවන පරිදි පළාත් විසින් ස්වකීය සංවර්ධන සැලසුම් පිළියෙල කළ යුතුය. එම ජාතික වැඩසටහන් පහත දැක්වේ.

- ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන
- ජාතික පරිසර කළමනාකරණ වැඩසටහන (හරිත සංවර්ධනය)
- ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන
- ජාතික වකුගඩු රෝග නිවාරණ වැඩසටහන

## 4. රජයේ සංවර්ධන ප්‍රමුඛතා

අතීතය හා සසඳනවිට, ඉහළ වර්ධන වේගයක් අත්කර ගැනීම හා සාමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම යන ද්විත්ව අරමුණු පෙරදැරි කරගත් "සමාජීය වෙළඳපොළ" සංකල්පය මත පදනම් වූ ආර්ථික උපායමාර්ගයක් රජය විසින් අනුගමනය කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ, මධ්‍යකාලීන සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමේ දී පහත දැක්වෙන ක්ෂේත්‍රයන් පහ සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත.

- රැකියා අවස්ථා දස ලක්ෂයක් ඇති කිරීම.
- ජනතාවගේ ආදායම් මට්ටම වැඩි කිරීම.

- ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම.
- ඉඩම් අයිතිය (විශේෂයෙන් ග්‍රාමීය හා වතු අංශ තුළ) සහතික කිරීම.
- පුළුල් හා ශක්තිමත් මධ්‍යම පන්තියක් නිර්මාණය කිරීම.

මෙම සන්දර්භය තුළ පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඇසුරින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායකවීම පළාත් මගින් අපේක්ෂා කෙරේ.

- ජාත්‍යන්තර වෙළඳපොළ හා සම්බන්ධවීමට සුළු හා මහා පරිමාණ ගොවීන් හා ව්‍යවසායකයින් උනන්දු කරවීම.
- පළාත් මට්ටමෙන් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරලීම.
- ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම හා ගොවීන්ගේ තීරණාත්මක ගැටළු කෙරෙහි අවධානය යොමු කරලීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- රැකියා දස ලක්ෂයක් බිහි කිරීමේ ජාතික වැඩසටහනට දායක වීම.
- ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කරලීම.
- අවශ්‍ය කරනු ලබන පහසුකම් හා සේවාවන් සැපයීම මගින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරලීම.
- රට තුළ මානව සම්පත වැඩිදියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- දිළිඳු පවුල් කේන්ද්‍ර කරගනිමින් දිළිඳුකම අඩු කරලීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

## 5. 2018 අයවැය කථාවේ දැක්වෙන ප්‍රධාන කරුණු

2018 අයවැය කථාවේ අන්තර්ගත යෝජනා හා ප්‍රතිපත්ති මගින් නව දිශානතීන් දෙසට රට යොමු කරවීමට ඉලක්ක කර තිබෙන අතර, පහත දැක්වෙන ක්‍රියාමාර්ග තුළින් ශක්තිමත්, වැඩි ප්‍රතිඵල සහිත, තිරසාර අනාගතයක් වෙත ළඟාවීම අපේක්ෂා කෙරේ.

- සාගරය හා ගොඩබිම සතු සම්පත් තිරසාර අයුරින් උපයෝජනයට ගැනීම ඉලක්ක කරගත් නීල-හරිත ආර්ථිකයක්.
- සියලු පුරවැසියනට දියුණු වීමට අවකාශ සැලසෙන ව්‍යවසායකත්ව ක්ෂේම භූමියක්.
- ආර්ථිකයට විශාල වශයෙන් දායකවීම හා ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සම්බන්ධවීම උනන්දු කරවීම තුළින් කාන්තාවන් බලගැන්වීම.
- නවෝත්පාදන දිරිගැන්වීම හා විශ්ව තාක්ෂණයට ප්‍රවේශවීම සහතික කෙරෙන ජාතික මට්ටමේ පාරිසරික පද්ධතියක්.
- සෑම දරුවෙකුටම වසර 13 දක්වා අනිවාර්ය අධ්‍යාපනය සහ තාක්ෂණික අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනයට අවස්ථා ලැබීමේ අභිමානය.
- භුදු භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයකට වඩා ඉදිරියට යාම හා ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම සඳහා වෙළඳ ලිහිල්කරණය.

### 6. පරිහරණය කිරීමට සුදුසු අදාල ප්‍රකාශන

පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමට ප්‍රථමයෙන් අදාල වැදගත් ප්‍රකාශන වෙත යොමුවීම තුළින් වර්තමාන ප්‍රතිපත්ති, සංවර්ධන උපායමාර්ග සහ රටෙහි ආර්ථික හා සමාජයීය උපනතීන් පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවනු ඇති අතර, ඒ සඳහා වඩාත් වැදගත් ලේඛන සමහරක් පහත දැක්වේ.

- 2025 දැක්ම
- 2030 න්‍යාය පත්‍රය හා තිරසාර සංවර්ධනය
- රාජ්‍ය ආයෝජන වැඩසටහන
- 2018 අයවැය කථාව
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද වාර්ෂික වාර්තා සහ වර්තමාන ආර්ථික ප්‍රවණතා අඩංගු ලේඛන
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්තා
- ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෑතදී පළකරන ලද වාර්තා
- අනෙකුත් අදාල ප්‍රකාශන

### 7. ආංශික මාර්ගෝපදේශ

#### 7.1. සමාජ යටිතල පහසුකම්

**අධ්‍යාපනය**

අධ්‍යාපන අංශය තුළ ආයෝජන සිදු කිරීමේ දී දෘඪ යටිතල පහසුකම්වලට වඩා මෘදු යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙම ආයෝජන, දැනුම් ආර්ථිකය මත පදනම් වූ තිරසාර සංවර්ධනය ළඟා කරගැනීම සඳහා අවශ්‍ය වන මූලික යෝග්‍යතාවයෙන් හා කුසලතාවන්ගෙන් යුත් අධ්‍යාපනයෙන් හා විනයගරුකභාවයෙන් පොහොසත් ජාතියක් නිර්මාණය කෙරෙන මානව සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණ මත කේන්ද්‍රගත කළ යුතු වේ. සියළු මූලික අවශ්‍යතාවයන් සපිරෙන පරිදි ප්‍රාථමික හා ද්විතීයික පාසල් වැඩිදියුණු කිරීම සහ ගුරුවරුනට අවශ්‍ය පුහුණුව ලබාදීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට හා ප්‍රමිතිය පවත්වාගැනීම කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතු වේ. මෙම උත්සාහයේ දී ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් අඩු නොදියුණු ග්‍රාමීය ප්‍රදේශ වෙත ප්‍රමුඛතාවය ලබාදීම අත්‍යාවශ්‍ය වේ.

**බටහිර වෛද්‍ය සේවාව**

සෞඛ්‍ය අංශයට අයත් වැඩසටහන් හා ව්‍යාපෘති රෝග නිවාරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහි කේන්ද්‍රගත කළ යුතු වේ. සියලුම රෝහල්වල සුදුසුකම් සහිත කාර්යමණ්ඩල ලබාදෙමින් අවශ්‍ය කරනු ලබන භෞතික යටිතල පහසුකම් හා උපකරණ ප්‍රමාණවත් පරිදි සැපයීම සිදු කළ යුතු වේ. මෙහිදී, සෞඛ්‍යයට අදාල දර්ශක අපේක්ෂිත මට්ටමට නොමැති ග්‍රාමීය ප්‍රදේශවලට මූලික අවධානය යොමු කිරීම අවශ්‍යය. රෝගීන් සඳහා සතුටුදායක සේවාවක් සැපයීම හා හොඳ සෞඛ්‍ය පුරුදු කරා යොමු කරවීම අතිශයින් වැදගත්

වනු ඇත. මෙම සන්දර්භය තුළ, බෝ නොවන රෝග මෙන්ම බෝවන රෝග වළක්වාලීම හා ඒවාට ප්‍රතිකර්ම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, මනා පෝෂණය හා ආහාර සුරක්ෂිතතාවයට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද සැලකිල්ල යොමු කිරීම වැදගත් වේ.

**දේශීය වෛද්‍ය සේවාව**

ලේඛනගත නොවූ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම සිදු කළ යුතු අතර, ඒ අනුව, අනාගත පරම්පරාවට එම දැනුම භාවිතා කිරීම සඳහා අවකාශ සලසාදීම සිදුකළ යුතුය. තවද, සාම්ප්‍රදායික වෛද්‍යවරුන්ගේ සේවාව ඵලදායී අයුරින් සමාජයට ලබාදීම සහතික කරලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ඉතා ගුණාත්මක වෛද්‍ය සේවාවක් ජනතාවට ලබාදීම සඳහා අදාල පහසුකම් නවීකරණය කිරීම සිදුකළ යුතුය.

**ක්‍රීඩා**

පිළිවෙලින් පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩකයින්ට ළඟා විය හැකි වන පරිදි ක්‍රීඩා කටයුතු වැඩිදියුණු කිරීම සිදු කළ යුතු අතර, ක්‍රීඩා හා විනෝදාස්වාද කාර්යයන්හි නිරත වීම මගින් ප්‍රජාවට නීරෝගී ජීවන රටාවක් පවත්වා ගැනීමෙහිලා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා පියවර ගැනීම සිදුකළ යුතුය.

**පරිවාස හා ළමාරක්ෂාව**

ආයතනගත කිරීම හා හොඳ පුරවැසියන් ලෙස සමාජය සමග බද්ධ කිරීම තුළින් සමාජයීය වශයෙන් අගතියට පත් ළමුන් පුනරුත්ථාපනය කිරීම සඳහා මෙම ප්‍රතිපාදන භාවිතා කළ යුතු වේ. පරිවාස භාරයේ සිටින ළමුන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව ද ඇතුළත්ව ඔවුනගේ දෛනික අවශ්‍යතා හා ශුභසාධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. වයස අවුරුදු 18 ට පැමිණීමෙන් පසු අදාල ළමුන් ඵලදායී ප්‍රජා සාමාජිකයින් ලෙස සමාජය වෙත යොමු කිරීම පිණිස පරිවාස කාලසීමාව තුළදී ඔවුනගේ කුසලතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. එමෙන්ම, ප්‍රමුඛතාවය ලබාදිය යුතු අනෙකුත් ක්ෂේත්‍ර වනුයේ, කායික හා මානසික සෞඛ්‍ය සංවර්ධනය, අසාධාරණයට ලක්වූ ළමුන් සමාජගත කිරීම සහ විධිමත් අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමයි.

**සමාජ සේවා**

රෝගී පුද්ගලයින්, වයස්ගත පුද්ගලයින්, ශාරීරික දුබලතාවයන්ගෙන් යුත් පුද්ගලයින් හා අනාථභාවයට ලක්වූ පුද්ගලයින් වැනි සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයනට පත්වූවන්ගේ ශුභසාධනය සහතික කරලීම පිණිස මෙම අංශයට අයත් ප්‍රාග්ධන ප්‍රදාන වෙන්කර ඇත. එක්සත් ජාතීන්ගේ පොදු සම්මුතිය හා රටෙහි පවත්නා නීති හා රෙගුලාසිවලට අනුගත වෙමින් වැඩිහිටි නිවාස ස්ථාපනය කිරීම හා ඒවා නඩත්තු කිරීම සඳහා පළාත් අධිකාරීන් විසින් ක්‍රියා කළ යුතුව ඇත. තවද, ශාරීරික දුබලතාවයන්ගෙන් පෙලෙන පුද්ගලයින් (ආබාධිතයින්) සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් සතුටුදායක මට්ටමේ දායකත්වයක් ලබාදිය යුතුය. එමෙන්ම, වයස්ගත හා ආබාධිත පුද්ගලයින් ස්වකීය නිවාසවලම තබාගනිමින් රැකබලා ගැනීම සඳහා ප්‍රජාව උනන්දු කරවීමට අවශ්‍ය උපායමාර්ග සහ වැඩපිළිවෙලවල් හඳුන්වාදීම වැදගත් වේ. ස්වකීය සමාජමය ගෞරවය ප්‍රවර්ධනය වන පරිදි ආබාධිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා අවස්ථා හඳුන්වාදීම ද අත්‍යවශ්‍ය කාර්යයක් වේ.

**සංස්කෘතික හා ආගමික කටයුතු**

අනාගත පරම්පරාවට සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කරදීම සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙම අරමුදල් යෙදවිය යුතුය. අදාල වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනාගැනීමේ දී ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය යන දෙවර්ගයේම සංස්කෘතික වත්කම් කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු වේ.

**නිවාස**

නිවාස සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන අඩු ආදායම්ලාභී හා අවශ්‍යතාවය සහිත පවුල්වලට නිවාස සැපයිම වෙනුවෙන් භාවිතා කළ යුතු වේ. අඩු ආදායම්ලාභී පවුල් කේන්ද්‍රකර ගනිමින් නිවාස සංවර්ධනය සඳහා අරමුදල් යෙදවීමේ දී මහජන සහභාගිත්වය ලබාගැනීම උනන්දු කරවිය යුතුය. තවද, සුදුසු ක්‍රමවේදයක් භාවිතයට ගනිමින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහනදායී නිවාස ණය සැපයීම ප්‍රවර්ධනය කළ යුතු වේ.

**සමූපකාර**

සමූපකාර ව්‍යාපාරයේ සංවර්ධනය පිණිස වූ වැඩසටහන් කේන්ද්‍ර කරගනිමින් මෙම අරමුදල් භාවිතා කළ යුතු වේ.

## 7.2. ආර්ථික යටිතල පහසුකම්

**පළාත් මාර්ග**

ආරක්ෂාව හා සමානාත්මතාවය තහවුරු කරන අතර, කාර්යක්ෂම මාර්ග ජාලයක් නඩත්තු කිරීම සහ විශාල හා අලුතින් බිහිවන නගර, කුඩා නගර, ආර්ථික මධ්‍යස්ථාන හා ග්‍රාමීය කේන්ද්‍රස්ථාන එකිනෙක සම්බන්ධ කරලිම සියලුම අංශවල කාර්යක්ෂම සේවාවන් පවත්වාගෙන යාම පිණිස අත්‍යවශ්‍ය වේ. මාර්ග ජාලයන්හි පවත්නා බාධාවන් ඉවත් කිරීම, පාලම් ඉදිකිරීම මගින් මාර්ග අවහිරතා ඉවත් කිරීම, පෝෂක මාර්ග ඉදිකිරීම මගින් ග්‍රාමීය කේන්ද්‍රස්ථාන ආසන්න කුඩා නගරවලට සම්බන්ධ කිරීම, ජලාපවහන පද්ධති නඩත්තු කිරීම සහ අනෙකුත් අදාල ව්‍යුහයන් ඉදිකිරීම ආදිය මෙහිදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන උපායමාර්ග සමහරක් වේ. මාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් ඒවායේ නිමැවුම හා ප්‍රතිඵල පැහැදිලිව හඳුනාගැනිම අත්‍යවශ්‍ය කරුණකි.

**වතු යටිතල පහසුකම්**

වතුවල ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම පිණිස අවශ්‍ය කරනු ලබන සමාජයීය හා ආර්ථික යටිතල පහසුකම් (උදා: සනීපාරක්ෂක පහසුකම්, ආරක්ෂිත පානීය ජලය, වතු මාර්ග ආදිය) සැපයීම සඳහා මෙම ප්‍රතිපාදන භාවිතා කළ යුතු වේ. මෙම ව්‍යාපෘති හඳුනාගැනීමේදී "වතු ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020)" පිළිබඳ අවධානය යොමු කළ යුතු බවට මෙහිදී යෝජනා කෙරේ.

**ප්‍රවාහනය**

මෙහිදී වැඩිදියුණු කරන ලද පහසුකම්වලින් සමන්විත ගුණාත්මක මගී සේවාවක් සැපයීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. මෙම ක්‍රියාවලියේ දී අවශ්‍ය කරනු ලබන මූලික පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගන්නා අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ජාතික ප්‍රවාහන කොමිෂම සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු වේ. බස් රථ නැවතුම් පොළවල්හි සාප්පු සංකීර්ණ හා

ආපනශාලා වැනි වාණිජ මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන භාවිතා නොකළ යුතුය. එමෙන්ම, බස් රථ නැවතුම් පොළවල් හා බස් රථ නැවතුම් ස්ථාන (Bus Stand & Halting Places) ඉදිකිරීමේ දී පිරිවැය-ඵලදායිතාවය සලකා බලා පොදු ආකාරයේ සැලසුම් (Type Plans) භාවිතයට ගැනීම වඩා යෝග්‍ය වේ.

**ඉඩම්**

අදාල නීතිරීති ක්‍රියාවට නැංවීම, ආයතනික අරමුණු සඳහා රජයේ ඉඩම් පවරා ගැනීම සහ පළාත් මට්ටමෙන් ඉඩම් බැංකු පවත්වාගෙනයාම වැනි කරුණු සම්බන්ධයෙන් මෙම අරමුදල් භාවිතයට ගැනීම සිදු කළ යුතු වේ. තවද, රජයේ ඉඩම්වල සංරක්ෂණ කටයුතු සඳහා මෙම අරමුදල් භාවිතයට ගත හැක.

**කෘෂිකර්මය**

ආහාර නිෂ්පාදන කර්මාන්තය යනු, අනෙකුත් ආංශික නිෂ්පාදිතයන් සමග සම්බන්ධ කළ හැකි ප්‍රධාන ක්ෂේත්‍රයන්ගෙන් එකකි. කෘෂිකර්ම අංශය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලීම ප්‍රවර්ධනය කිරීමේ දී නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම, කුඩා හා මධ්‍යම පරිමාණයේ වාණිජ වගාවන් පහසුකරලීම, කෘෂිකර්මය මත පදනම් වූ හා එකතු කළ අගය සහිත කර්මාන්ත දිරිගැන්වීම, පසු අස්වනු හානි අවම කරලීම, අත්හැර දැමූ කුඹුරු ඉඩම්වල විකල්ප බෝග භාවිතය හඳුන්වාදීම, මල් වගාව හා ජලජීවී වගාව උනන්දු කරවීම, කෘෂි මාර්ග ඉදිකිරීම හා නඩත්තුව හා පළාත් කෘෂිකාර්මික ගොවිපලවල් හා පුහුණු මධ්‍යස්ථාන නවීකරණය වැනි කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු වේ. තවද, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් තිරසාර ආර්ථික වර්ධනය ළඟා කරගැනීම සහ කෘෂිකර්මය හා කෘෂි ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවත්නා තරගකාරිත්වයට මුහුණදීමේ ශක්තිය පවත්වාගෙන යෑම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වනු ඇත.

**පශු සම්පත්**

ඉහළ පෝෂණ හා ආදායම් තත්ත්වයන් සහතික කරලමින් පළාත තුළ නීරෝගී හා ඵලදායී සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාම තුළින් ජනතාව සඳහා කිරි, බිත්තර හා මස්වල සැපයුම ප්‍රමාණවත් ලෙස ඉහළ නැංවීම මෙම අංශය මගින් අපේක්ෂා කෙරේ. මේ අනුව, මෙම අංශය තුළ ගොවිපලවල් සඳහා කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවක් ඇති කරලීම, කුඩා හා මධ්‍ය පරිමාණයේ වාණිජමය සත්ත්ව ගොවිපලවල් පවත්වාගෙන යෑම පහසු කරලීම, වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත ප්‍රවර්ධනය, කිරි එකතු කිරීම හා ගබඩා කිරීමේ අවශ්‍යතාවයන් පහසු කරලීම සහ කෘත්‍රිම සිංචනය මගින් දෙමුහුන් සතුන් ප්‍රවර්ධනය කිරීම වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

**මිරිදිය ධීවර කටයුතු**

මෙම අංශය තුළ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම, අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම හා සුරතල් මසුන් වගා කිරීම හා සුරතල් මසුන් වගා කිරීම උනන්දු කරවීම යන කරුණු කෙරෙහි ප්‍රමුඛතාව දිය යුතුය. ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරියේ (NAQDA) සහයෝගය ඇති ධීවර ප්‍රජාව සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික දැනුම ලබාදීමට පියවර ගැනීම කළ යුතුය. අදාල භාණ්ඩ හා සේවාවන් මත පදනම් වූ ව්‍යවසායකයන් බවට පත්වීමේ හැකියාව ග්‍රාමීය ප්‍රජාවට ලැබෙන පරිදි ධීවර සමති ශක්තිමත් කිරීම හා ඒවායේ කළමනාකරණය වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. මිදිරිය ධීවර නිෂ්පාදන භාවිතයට ගෙන සිදු කරනු ලබන අගය එකතු කළ කර්මාන්ත ප්‍රවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදු කළ යුතුය. තවද, ධීවර ආම්පන්න හා උපකරණ සපයාදීම මගින් ධීවර ජනයාට

උපකාර කළ යුතු වේ. මෙම ක්‍රියාමාර්ග තුළින් ග්‍රාමීය ප්‍රජාවට මත්ස්‍ය නිෂ්පාදන හරහා ස්වකීය පෝෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස අවස්ථාව ලබාදිය යුතු වේ.

**වාරිමාර්ග**

දැනට පවත්නා වාරිමාර්ග පද්ධති යටතේ වගා කළ හැකි ඉඩම්වලට ප්‍රමාණවත් පරිදි වාරි ජලය සැපයීම සහතික කරලීම, වාරිමාර්ග පද්ධති සංවර්ධනය, ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම, ක්‍රමවත් ජල කළමනාකරණය සහ ගොවි සංවිධානවල සහභාගිත්වය උපරිම අයුරින් ලබාගැනීම ආදිය මෙම අංශය තුළට අයත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මෙම සංවර්ධන ප්‍රයත්නය සඵල කරගැනීම පිණිස "පැරණි එල්ලංගා ක්‍රමවේදය" (Ancient Cascade System) ඉතා උපකාරී වනු ඇත. ප්‍රශස්ත ජල කළමනාකරන ක්‍රමවේදයන් මගින් කුඹුරුවලට අමතරව අනෙකුත් ක්ෂේත්‍ර බෝග වර්ග සඳහා ද වාරි ජලය සැපයීම සිදු කළ යුතු වේ. කාර්යක්ෂම ජල කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව ගොවි ප්‍රජාව දැනුවත් කරනුවස් සුදුසු වැඩසටහන් සංවිධානය කිරීම සිදු කළ යුතුය.

**ග්‍රාමීය සංවර්ධනය**

මෙම අංශයට අයත් අරමුදල් ග්‍රාමීය මාර්ග, කුඩා පාලම් හා බෝක්කු, ග්‍රාමීය වෙළඳපොළ පහසුකම්, සුසාන භූමි, පුස්තකාල හා ග්‍රාමීය ප්‍රජා ජල සැපයුම වැනි සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතුය. මෙවැනි ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑම අවශ්‍ය කෙරේ. තවද, නව තාක්ෂණය හා වෙළඳපොළ සම්බන්ධයෙන් අවශ්‍ය සහාය ලබාගැනීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය හා අපනයන සංවර්ධන මණ්ඩලය සමග සමීපව ක්‍රියා කිරීමට යෝජනා කෙරේ. මෙවැනි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ප්‍රාදේශීය මට්ටමෙන් ඒවායේ තිරසරභාවය තහවුරු කරනුවස් ස්වෙච්ඡා සංවිධාන හා ප්‍රජාමූල සංවිධානවල සහභාගිත්වය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

**කුඩා කර්මාන්ත**

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්ගේ ව්‍යාපාර තත්ත්වයන් වැඩිදියුණු කිරීම, ඔවුන් තුළ තරගකාරිත්වය, ව්‍යවසායකත්ව හැකියාව, තාක්ෂණය හුවමාරුවීම, ඵලදායිතා වර්ධනය හා අලෙවි ප්‍රවර්ධන හා සාපේක්ෂ වාසි ළඟාකර ගැනීමට අදාල දැනුවත්භාවය ඇති කිරීම වැනි කරුණු මෙහිදී ප්‍රධාන වේ. තවද, වෙළඳපොළ සම්බන්ධතා පවත්වාගෙන යෑම හා නව තාක්ෂණය හඳුන්වාදීම සිදු කරනු ලබන අතර, සාම්ප්‍රදායික නිෂ්පාදන හා ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය සඳහා උනන්දු කරවීම අවශ්‍ය කෙරේ. මෙම අංශය දියුණු කිරීමේ දී ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් මෙන්ම වාණිජ මණ්ඩල, ජාතික ශිල්ප සභාව හා කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි ආයතන සමග මනා සම්බන්ධීකරණයක් ගොඩනගා ගැනීම වැදගත් වනු ඇත. කාර්යක්ෂමතාවය ඉහළ නංවනුවස් ව්‍යාපාර කටයුතු විෂයෙහි පෞද්ගලික අංශයේ සහභාගිත්වය උනන්දු කළ යුතු වේ. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් අවසානයේ පිරිනමනු ලබන සහතික, ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ Framework) සමග අනුගත විය යුතුය.

**ග්‍රාමීය විදුලිබලය**

මෙම ප්‍රතිපාදන ග්‍රාමීය ප්‍රදේශයන්හි ජාතික විදුලි පද්ධතියෙන් දිගු කිරීම් ලබාදීම හා ජාතික විදුලි පද්ධතියෙන් විදුලිබලය ලබාදිය නොහැකි ප්‍රදේශවල ශක්‍යතාවයෙන් යුත් විකල්ප විදුලිබල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතයට ගත හැකිය. ජාතික විදුලි පද්ධතියෙන් දිගු කිරීම් ලබාදීමේ දී පොදු දිගු කිරීම් සඳහා පමණක් අරමුදල් යෙදවිය යුතු අතර, පෞද්ගලික මට්ටමෙන් කෙරෙන දිගු කිරීම් සඳහා මෙම අරමුදල් භාවිතා කළ නොහැක. විකල්ප බලශක්ති මූලාශ්‍ර සැපයීමේ දී හා විදුලිබලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමේ දී

සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (Sustainable Energy Authority) සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.

**සංචාරක කර්මාන්තය**

සංචාරක කර්මාන්තයට අදාල රාජ්‍ය ප්‍රතිපත්තිය කේන්ද්‍රගත වී තිබෙනුයේ "සංචාරය සඳහා ලොව අගනා දිවයින බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම" යන තේමාව මතය. විවිධාංගීකරණය වූ එනම්, ස්වභාවධර්මය, ත්‍රාසය, කෘෂිකර්මය, සංස්කෘතිය, ක්‍රීඩා හා පරිසරය වැනි විවිධ අංශ ඔස්සේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුය. තවද, මැටි කර්මාන්තය ආශ්‍රිත සංචාරක ගම්මාන, හස්ත කර්මාන්ත ආශ්‍රිත සංචාරක ගම්මාන හා කොහු නිෂ්පාදන ආශ්‍රිත සංචාරක ගම්මාන වැනි සාම්ප්‍රදායික හා පැරණි කර්මාන්ත මත පදනම් වූ විවිධ තේමාවන් ඔස්සේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේ අවස්ථා සැලකිල්ලට භාජනය කළ හැකිය. ප්‍රධාන සංචාරක උපායමාර්ගයන් සැකසීමේ දී යටිතල පහසුකම් හා සේවාවන් වැඩිදියුණු කිරිම, රැකියා අවස්ථා සඳහා තරුණ ප්‍රජාව වෙත පහසුකම් සැපයිම, පළාත තුළ විශාල වශයෙන් දක්නට ලැබෙන අඩු ප්‍රසිද්ධියක් සහිත ආකර්ශනීය ස්ථාන හඳුනාගැනීම සහ නැරඹීම් මැදිරි, මෝටර් රථ නැවතුම් උද්‍යාන, සේවා සැපයුම් ස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, මුහුදු ස්නාන ප්‍රදේශ ආසන්නයේ මිරිදිය ස්නානය කිරීමේ පහසුකම් වැනි නරඹන්නන් සඳහා වූ ආකර්ශණීය පහසුකම් සැපයීම වැනි සංරචක මත ඒවා කේන්ද්‍රගත විය යුතුය.

**පළාත් පාලනය**

- **පළාත් පාලන මාර්ග**

පළාත් පාලන මාර්ග නිසි කලට මෙහෙයුම් හා නඩත්තුව සිදු කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු වේ. පළාත් පාලන මාර්ග තිරසාර පදනමකින් නිසි පරිදි ක්‍රියාත්මක වීම සහතික කරලනු පිණිස පවත්නා තත්ත්වයන් මත ඒවා මුළුමනින් හෝ ආංශික වශයෙන් කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම සිදුකළ යුතුය.

- **ප්‍රජා ජල සම්පාදනය**

මෙම අරමුදල් භාවිතයට ගනිමින් ආරක්ෂිත පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක සේවා සැපයීම සිදු කළ යුතුය. නව ප්‍රජා ජල යෝජනා ක්‍රම සැලසුම් කරන අවධියේ දී මනා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කළ යුතුය. පානීය ජලය සැපයීමේ දී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ සහතික කරලීම අවශ්‍ය වේ. පොදු ළිං හා ස්නානය කරනු ලබන ස්ථාන ක්‍රමික අයුරින් නඩත්තු කිරීම අත්‍යවශ්‍ය වන අතර, ඒවා සෞඛ්‍යමය වශයෙන් සුදුසු තත්ත්වයක පවත්වාගත යුතු වේ.

- **අපද්‍රව්‍ය කළමනාකරණය**

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම, කොම්පෝස්ට් පොහොර නිපදවීම සහ අපද්‍රව්‍ය ආර්ථිකමය වටිනාකමකින් යුත් නිෂ්පාදන බවට පත්කිරීම වැනි කාර්යයන් සිදු කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. අපද්‍රව්‍ය ජනනය වන ස්ථානවලදීම වර්ග කිරීම, දිරණ අපද්‍රව්‍ය ඉවත් කිරීම හා ප්‍රමාණවත් ඉඩකඩ තිබෙන පරිසරයන්හිදී ඒවා කොම්පොස්ට් පොහොර බවට හැරවීම සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම අවශ්‍ය වේ.

- **අනෙකුත් පළාත් පාලන සේවාවන්**

ඉහත දක්වන ලද පළාත් පාලන අංශයට අයත් උප වැඩසටහන් යටතේ ආවරණය නොවූ පුස්තකාල, ආදාහනාගාර, බස් නැවතුම්පොළවල්, සති පොළවල් හා ළමා උද්‍යාන වැනි කාර්යයන් මේ යටතේ ඇතුළත් කළ හැකිය.

**නම්‍යශීලී ප්‍රතිපාදන**

මෙම අරමුදල් වෙන් කර තිබෙනුයේ මූලික සැලැස්මෙහි අන්තර්ගත නොවූ හදිසි අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් භාවිතා කිරීම සඳහාය.

**විශේෂ අවශ්‍යතාවයන් සහිත ගම්මාන සඳහා වූ දීමනා**

මේ යටතේ මූලික යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් නොමැති වීම නිසා ජීවනෝපායයන් සකසා ගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණදී සිටින හා ඒ අනුව සංවර්ධනයේ දී පසුබෑමකට ලක්ව ඇති ගම්මාන හඳුනාගැනීම පළාත් අධිකාරීන්ගෙන් අපේක්ෂා කෙරේ. මෙවැනි අහිතකර තත්ත්වයන් මගහැරවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අදාල ව්‍යාපෘති කේන්ද්‍රගත විය යුතු වේ. මෙම අරමුදල් ආයෝජනය කිරීමේ දි විවිධ ජන මාධ්‍යයන් හා සංවිධාන මගින් පළාත් හා ජාතික මට්ටමෙන් පෙන්වා දෙනු ලබන ගැටළු පිළිබඳව ද සැලකිලිමත් වීම වැදගත් වේ.

**පොදු මාර්ගෝපදේශ**

I. අක්‍රමවත් අයුරින් සිදු වන සංවර්ධන කටයුතු මගහැරවීම පිණිස ප්‍රධාන අංශ සඳහා සංයුක්ත සැලසුම් (Master Plans) සකස් කළ යුතු වේ.

II. ප්‍රාදේශීය වශයෙන් පවත්නා වාසි සහගත තත්ත්වයන් ප්‍රයෝජනයට ගැනීම හා අඩු වරප්‍රසාදලාභී ප්‍රජා කණ්ඩායම්වලට අවශ්‍ය පහසුකම් ලබාදීම සහතික කරලනුවස් ආංශික මට්ටමෙන් සම්පත් සිතියම්ගත කිරීම (Resource Mapping) සිදු කළ යුතුය.

III. කාර්යසාධනය මත පදනම් වූ අයවැය ක්‍රමවේදයට අනුගත වෙමින් 2018 මුදල් වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති ඒ අයුරින්ම නිම කිරීම සඳහා පළාත් විසින් සෑම උත්සාහයක්ම ගත යුතුය.

IV. සංවර්ධන සැලසුම් ක්‍රියාවට නැංවීමේ දි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මැනවින් අනුගමනය කිරීම පළාත් අධිකාරීන්ගේ වගකීමක් වේ.

V. අරමුදල් සීමාසහිත හෙයින්, ප්‍රශස්ත ලෙස සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව හා දිගු කාලීන ප්‍රතිඵල පිළිබඳව සැලකිලිමත් වෙමින් තාර්කිකව ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම ඉතා වැදගත් වේ.

VI. කිසියම් ව්‍යාපෘතියක් නිම කිරීමට වසරකට වඩා කාලයක් ගත වන්නේ නම් ඊළඟ වර්ෂයන්ට අවශ්‍ය කරනු ලබන මූල්‍ය සම්පත් හඳුනාගනිමින් ව්‍යාපෘතිය අදියරගත කළ යුතු වේ. මෙහිදී, පෙර වර්ෂයේ සැලස්ම විමසුමට ලක් කිරීම ද ඉතා වැදගත් වේ.

VII. යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා පිරිවැය ප්‍රතිලාභ (cost-benefit) විශ්ලේෂණය අනුගමනය කළ යුතු අතර, සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘතිවල දි පිරිවැය සාඵල්‍යතා (cost-effective) මූලධර්මය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

VIII. ව්‍යාපෘති ජනතා අයිතියට පැවරීමට පෙර ඒවායේ ශක්‍යතාවය, ගුණාත්මකභාවය / ප්‍රමිතීන් සහ නඩත්තු ක්‍රමවේදය පිළිබඳව නිසි අවධානය යොමු කළ යුතු වේ.

IX. අදාල ප්‍රදේශයේ භූමි ලක්ෂණ හා දේශගුණික සාධක කෙරෙහි අවධානය යොමු කරමින්, රජයේ ගොඩනැගිලි ඉදිකිරිමේ දී හැකිතාක් දුරට පොදු වූ සැලසුම් ආකෘති (Type Plans) භාවිතයට ගත යුතු වේ.

X. ගොඩනැගිලි හා වෙනත් ව්‍යුහයන් ඉදිකිරීමේ දී ඉඩකඩ උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම හා අනවශ්‍ය ව්‍යුහයන් ඉදිකිරීමෙන් වැළකීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

XI. හැකි සෑම අවස්ථාවක්ම, රජයට දැරීමට සිදු වන වැය බර අඩුකරලීම පිණිස අදාල පාර්ශ්වයන්ගෙන් (උදා: පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජාමූල සංවිධාන ආදිය) මූල්‍ය දායකත්වයක් ලබාගැනීමට පියවර ගැනීම යෝග්‍ය වේ.

XII. වාණිජමය ශක්‍යතාවයකින් යුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හැකිතාක් දුරට සුදුසු ක්‍රමවේද හරහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබාගැනීමට ක්‍රියා කළ යුතුය. (උදා: රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය).

XIII. පොදු වත්කම් නිර්මාණය කිරීමේ දී සංවර්ධනයෙන් අඩු හෝ අඩු වරප්‍රසාදලාභී ප්‍රදේශවලට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

XIV. ජාතික හා පළාත් මට්ටමෙන් සිදු විය හැකි ද්විකරණය වැළැක්වීම සඳහා හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

XV. පරිසරය, කාන්තා කටයුතු හා තරුණ කටයුතු වැනි පොදුවේ ගැනෙන අංශ (Cross-cutting Sectors) පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වන අතර, අනෙකුත් ප්‍රධාන අංශවලට අයත් ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත්වීම අවශ්‍ය කෙරේ.

XVI. ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය පිළිබඳ අනුකූල වූ අයවැයකරණය ඉලක්ක කරගත් 2016.03.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගත වෙමින් ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මුළු ප්‍රතිපාදනවලින් 25% ක් කාන්තා අභිවෘද්ධිය උදෙසා වෙන් කළ යුතු වේ.

XVII. ග්‍රාම ශක්ති ව්‍යාපාරයේ මූලධර්මවලට අනුගත වෙමින් ශක්තිමත් කරලීම, බලගැන්වීම හා සංවිධානගත කිරීම හරහා දිළිඳු පවුල් දිළිඳුභාවයෙන් මුදා ගැනීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. මෙහිදී අදාල අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් මෙම ව්‍යාපාරයට ක්‍රියාශීලීව සහභාගී වීම අවශ්‍ය කෙරේ.

XVIII. 2015 වර්ෂයේ දෙසැම්බර් මස පැරිස් නුවරදී ලද කාලගුණික සමුළුවේදී (COP21) ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 195 ක් විසින් ගෝලීය වශයෙන් නීත්‍යානුකූලව පිළිගත් කාලගුණික තත්ත්වයන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ගිවිසුමකට එළඹින. මේ අනුව, සියලු පළාත් එහි ප්‍රධාන මූලධර්ම අනුගමනය කිරීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. ඒ අනුව, වායු විමෝචනය අඩු කිරීම, දේශගුණික තත්ත්වයන් ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒම හා දේශගුණික විපර්යාස නිසා ඇති වන අහිතකර ප්‍රතිඵල අවම කරගැනීම වැනි ක්‍රියාමාර්ග කෙරෙහි පළාත් බලධාරීන්ගේ අවධානය යොමු වීම ඉතා වැදගත් වේ. තවද, මෙහිලා කලාපීය හා ජාත්‍යන්තර සහයෝගීතාවය ප්‍රවර්ධනය කරලීම හා එකඟත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය කරුණක් සේ සැලකිය හැකිය.

XIX. ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන එහෙත් විවිධ හැකියාවන් සහිත පුද්ගලයින් බලගැන්වීම අරමුණු කොටගත් "ආබාධ සහිත පුද්ගලයින් පිණිස වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම" (NADP) නමින් හැඳින්වෙන බහු ආංශික රාමුව කෙරෙහි පළාත් බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය. මෙය ක්‍රියාවට නැංවීම සඳහා පළාත්වලින් සතුටුදායක මට්ටමේ දායකත්වයක් ලබාදීම සහතික කළ යුතුය.

## 8. වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ ක්‍රමවේදය

### 8.1. පළාත් සමාජ-ආර්ථික පැතිකඩ පිළියෙල කිරීම

ඔබ පළාත විසින් පහත දැක්වෙන තොරතුරු / දත්ත ඇතුළත් වන පරිදි සමාජ-ආර්ථික පැතිකඩක් සැකසිය යුතු වේ.

1. පාසල්, රෝහල් කුඩා වාරිමාර්ග වැව් ආදියෙහි ව්‍යාප්තිය දැක්වෙන පළාත් සිතියම.
2. පළාත පිළිබඳ විශ්ලේශනාත්මක ඉදිරිපත් කිරීමක්.
3. පළාතේ ප්‍රධාන සමාජ-ආර්ථික දත්ත.
4. 2018 වර්ෂය සඳහා පළාතට ලැබෙන මූල්‍ය සම්පත්.

#### 1. පළාත් සිතියම

පහත සඳහන් විස්තර ඇතුළත් වන පරිදි පළාත් සිතියම සැකසීමට යෝජනා කෙරේ.

- දිස්ත්‍රික් මායිම් සහිතව පළාතේ දිස්ත්‍රික්ක.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම් සහිතව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ.
- පළාතේ ප්‍රධාන මාර්ග ජාලය.
- සිතියමේ දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දරිද්‍රතා අනුපාතය.

#### 2. පළාත පිළිබඳ විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීමක්

- පළාත පිළිබඳ සාමාන්‍ය විස්තරයක්
- පළාතේ සමාජ හා ආර්ථික තත්ත්වය
- පළාතේ සාර්ව දර්ශකයන්ගේ වර්තමාන තත්ත්වය
- පළාත් දළ දේශීය නිෂ්පාදිතය
- ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාදාමය
- පළාතේ දරිද්‍රතාවය පිළිබඳ තත්ත්වය
- ඒක පුද්ගල ආදායම
- සේවා නියුක්තිය පිළිබඳ තත්ත්වය
- සේවා බෙදා හැරීම / සැපයීම

#### 3. පළාතේ ප්‍රධාන සමාජ-ආර්ථික දත්ත

පහත දැක්වෙන ප්‍රධාන දත්ත හා තොරතුරු සැලැස්මට ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

- සාමාන්‍ය තොරතුරු
- පළාත් දළ දේශීය නිෂ්පාදිතය
- දිළිඳුකම හා සේවා නියුක්තිය

- සෞඛ්‍යය
- අධ්‍යාපනය
- යටිතල පහසුකම්

(වැඩි විස්තර සඳහා ඇමුණුම - 1 බලන්න)

**4. 2018 වර්ෂය සඳහා පළාතට ලැබෙන මූල්‍ය සම්පත්**

මෙම කොටසෙහි පහත දැක්වෙන පරිදි 2018 වර්ෂය සඳහා පළාතට ලැබෙන ප්‍රදාන හා ව්‍යාපෘති අරමුදල් සඳහන් කළ යුතුය.

**පුනරාවර්තන වියදම්** – (පහත දැක්වෙන අයිතමයනට අදාලව වියදම් ප්‍රකාශනයක් ඇතුළත් කරන්න)

- පුද්ගල පඩිනඩි
- ගමන් වියදම්
- සැපයුම්
- නඩත්තු වියදම්
- ගිවිසුම්ගත සේවා
- සංක්‍රාම
- ප්‍රදාන
- සහනාධාර
- අනෙකුත් පුනරාවර්තන වියදම්

**උප එකතුව**

- පළාත් පාලන වියදම් ප්‍රතිපූරණය
- පළාත් පාලන ආයතන සඳහා මෙහෙයුම් සහය

**පුනරාවර්තන වියදමේ මුළු එකතුව**

පුනරාවර්තන වියදම මූල්‍යකරණය

- ආදායම් බෙදා හැරීම
- සාමූහික ප්‍රදාන

***මුළු අරමුදල් -*** (පහත දැක්වෙන අයිතමයන් යටතේ මුළු අරමුදල් ප්‍රමාණය දැක්විය යුතුය)

- සාමූහික ප්‍රදාන
- පුනරාවර්තන වියදම් සඳහා ආදායම් බෙදා හැරීම
- උපමාන පාදක ප්‍රදාන
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

- සංවර්ධන ව්‍යාපෘති

**පළාතට ලැබෙන මුළු අරමුදල්**

අදාල වෙනත් තොරතුරු.

**8.2. අංශය පිළිබඳ විශ්ලේශනාත්මක ප්‍රකාශනය**

එක් එක් ආංශික සැලැස්ම තුළ පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතුය.

- දත්ත හා තොරතුරු සමග අංශයෙහි වර්තමාන තත්ත්වය.
- අංශයේ සේවා සැපයුම, වර්තමාන තත්ත්වය, වඩාත් ශක්තිමත් කිරීම හා ප්‍රසාරණය, අඩු දියුණු හා අඩු වරප්‍රසාදලාභී ප්‍රදේශවල සේවා සැපයුමේ ප්‍රසාරණය.
- ගැටළු, ප්‍රශ්ණ හා බාධාවන් හඳුනාගනිමින් සහ විශේෂිත, ආංශික අරමුණු ළඟා කරගැනිම පිණිස අංශය තුළ සිදු කළ යුතු ප්‍රමුඛ මැදිහත්වීම් නිර්දේශ කරමින් අංශයට අදාල විශ්ලේෂණාත්මක විස්තර.
- පළාත් සාර්ව ඉලක්ක ළඟා කරගැනීම සඳහා ආංශික දායකත්වය පැහැදිලි කිරීම.
- අංශයන්ට අදාල වෙනත් තොරතුරු.

**8.3. සංරචක සහ උප සංරචක භාවිතා කරමින් 2018 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවලට අදාලව වාර්ෂික ආයෝජන සැලැස්ම පිළියෙල කිරීම**

2018 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම සැකසීමේ දී සියලුම පළාත් විසින් එක් එක් අංශය යටතේ සංරචක (Compononts) හා උප සංරචක (Sub-components) ඇතුළත් කරමින් සපයා ඇති පොදු ආකෘති පත්‍රයට අනුව (ඇමුණුම - 2) එය පිළියෙල කළ යුතු වේ. මෙම සංරචක හා උප සංරචක සියලුම පළාත්වලට පොදු වේ. එසේවුවද, එක් එක් උප සංරචකය යටතේ "පුළුල් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර" (Broad Activity Areas) හඳුනා ගැනීම එක් එක් පළාත විසින් සිදු කළ යුතුය. මෙහිදී, එක් එක් පළාත සතු සාපේක්ෂ වාසි කෙරෙහි අවධානය යොමු කරමින් පළාත් අවශ්‍යතා අනුව එය සිදු කළ යුතු වේ. එමෙන්ම, පළාත විසින් "පුළුල් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර" යටතේ "ක්‍රියාකාරකම් ලැයිස්තුවක්" (List of Activities) හඳුනාගත යුතුය. අංශයක් යටතට ගැනෙන එක් එක් සංරචකයන් හෝ සංරචකයක් යටතෙට ගැනෙන එක් එක් උප සංරචකයක් සඳහා ආයෝජනය කිරීම අනිවාර්ය නොවූවද, පරිශීලනයේ පහසුව හා පළාත් අතර සංසන්දනයන් සිදු කිරීම පිණිස පොදු කේත අංක (Common Code Numbers) භාවිතා කිරීම වැදගත් වනු ඇත.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවලට අයත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සැකසීම පහත දැක්වෙන ආකෘති පත්‍ර (ඇමුණුම - 3 හා 4) භාවිතා කරමින් සිදු කළ යුතුය.

**ආකෘති පත්‍ර 3 :** ඒ ඒ සංරචකය තිරසාර සංවර්ධන ඉලක්ක සමග සම්බන්ධ වන පරිදි හා උප සංරචක, පුළුල් ක්‍රියාකාරකම් පරාස හා අයවැය ඇතුළත් වන පරිදි සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

**ආකෘති පත්‍ර 3a :** දිස්ත්‍රික් අයවැය සමග එක් එක් පුළුල් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර සඳහා ක්‍රියාකාරකම් ලැයිස්තු සැකසීම.

ඉහත දැක්වෙන සැලසුම් රාමුව හා ආකෘති පත්‍ර අනුරූපී ප්‍රතිඵල රාමුවක් වන අතර, එය සංවර්ධන මැදිහත්වීම්, ප්‍රතිඵල සහිත ආයෝජනය, කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල සම්බන්ධයෙන් මගපෙන්වීමක් ද වේ. ඒ අනුව, මෙම මාර්ගෝපදේශය තුළින් ඒකාබද්ධ ආංශික ක්‍රියාකාරී සැලසුම් රාමුවක් හඳුන්වාදී ඇත.

| **පළාත් සැලසුම් රාමුව** |
|---|
| අංශය / ඒජන්සිය |
| සංරචකය |
| උප සංරචක |
| පුළුල් ක්‍රියාකාරකම් පරාස |
| ක්‍රියාකාරකම් |

මෙම පළාත් සැලසුම් රාමුව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක (සංරචක තුළින්) දිගු කාලීන ප්‍රතිඵල (උප සංරචක තුළින්) අන්තර් පළාත් සන්සන්දනයක් සඳහා පොදු පසුබිමක් සකස් කර ඇති අතර, කෙටි කාලීන ප්‍රතිඵල (පුළුල් ක්‍රියාකාරකම් පරාස තුළින්) සහ ක්‍රියාකාරකම් හඳුනාගැනීම පළාත් විසින් සිදු කළ හැකි වන ලෙස සකස් වී ඇත.

ක්‍රියාකාරී සැලසුම් රාමුව, සම්මත ව්‍යාපෘති ප්‍රතිඵල රාමුව මෙන්ම වැඩසටහන් කාර්යසාධන අයවැයෙහි වියදම් රාමුව සමග අනුරූපි විය යුතුය. ක්‍රියාකාරී සැලසුම් රාමුව පළාත් සංවර්ධන ප්‍රතිඵල සඳහා දායකත්වය සපයන ආයතනික ප්‍රතිඵල රාමුව සඳහා පදනම සපයයි.

## <u>ක්‍රියාත්මකභාවයේ ගැලපීම</u>

| **වියදම් වර්ගීකරණයට අදාල අයවැය ක්‍රමය** | **පළාත් සැලසුම් රාමුව** | **ආංශික ප්‍රතිඵල දාමය** |
|---|---|---|
| ශීර්ෂය | අංශය / ඒජන්සිය | අරමුණු |
| වැඩසටහන | සංරචකය | තිරසාර සංවර්ධන ඉලක්ක |
| ව්‍යාපෘතිය | උප සංරචකය | ප්‍රතිවිපාකය |
| උප ව්‍යාපෘතිය | පුළුල් ක්‍රියාකාරකම් පරාස | නිමැවුම |
| අරමුණු කාණ්ඩ | ක්‍රියාකාරකම් | යෙදවුම |

ඉහත සඳහන් කර ඇති උපදෙස් කෙරෙහි නිසි අවධානය යොමු කරමින් 2018 වර්ෂයට අදාලව මැනවින් සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර - 3 හා ආකෘති පත්‍ර - 3a, එකඟතාවය ලබාගැනීම පිණිස

**2018 ජනවාරි 31** දිනට පෙර මුදල් කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙම මාර්ගෝපදේශයන්හි පිටපත් පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු / ආයතන, ප්‍රධානීන් හා අදාල අනෙකුත් පාර්ශවයන් වෙත ලැබීමට සැලැස්වීම සඳහා කාරුණික වන්න.

2018 වර්ෂය සඳහා සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ දී සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්තය සහතික කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඒ.ටී.එම්.යූ.ඩී.බී.තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත් :-

| | | |
|---|---|---|
| (i) | ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - දැ.පි. |
| (ii) | අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය | - දැ.පි. |
| (iii) | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | - දැ.පි. |
| (iv) | ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - දැ.පි. |
| (v) | ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - දැ.පි. |
| (vi) | විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව | - දැ.පි. |
| (vii) | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය | - දැ.පි. |
| (viii) | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - දැ.පි. |
| (ix) | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | - දැ.පි. |
| (x) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), සියලුම පළාත් | - අ.ක.ස. |
| (xi) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), සියලුම පළාත් | - අ.ක.ස. |
| (xii) | සහකාර විගණකාධිපති, සියලුම පළාත් | - අ.ක.ස. |